Department of Education, Sabaragamuwa Province/ Weekly School

සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

10 ශ්‍රේණිය

A.S.M.C.G.සමරකෝන් - කෑ/දෙහි/අම්තිරිගල මහා විද්‍යාලය

නිපුණතාවය - 9.0 තොරතුරු ලබා ගැනීම සඳහා සරල දත්ත සමුදා නිර්මාණය කරයි.
නිපුණතා මට්ටම - 9.1 දත්ත සමුදා සංකල්පය ගවේෂණය කරයි.

පෙළ පොතෙහි 263 පිටුවෙහි සිට 276 පිටුව දක්වා අධ්‍යයනය කර පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

01. 'දත්ත සමුදාය' යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

02. පහත උදාහරණයද ඇසුරු කර ගනිමින් අත්යුරු හා ඉලෙක්ට්‍රොනික දත්ත සමුදා සංසන්දනය කරන්න.



දුරකථන අංක



දුරකථන අංක

03. දත්ත සමුදායක ලක්ෂණ එකින් එක පැහැදිලි කරන්න.

04. සම්බන්ධිත දත්ත සමුදාය යන්න හඳුන්වන්න.

05. හිස්තැන් පුරවන්න.

i. ක්ෂේත්‍රයක් නම් කිරීම සඳහා .............................. භාවිතා කෙරේ.
ii. ක්ෂේත්‍ර සියල්ල එකතු වී .............................. සෑදේ.
iii. වගුවක රෙකෝඩ අනන්‍යව හඳුනා ගැනීම සඳහා ............................ භාවිතා කෙරේ.
iv. වගු දෙකක් අතර සම්බන්ධතාව ගොඩනැගීම සඳහා .............................. භාවිතා කෙරේ.

06. පහත දැක්වෙන්නේ සිසුන්ගේ ලකුණු ඇතුලත් කරන ලද වගුවකි. මෙහි එකම දත්තය නැවත නැවත ඇතුලත් වී ඇති බව පෙනේ.

| ඇතුළත් වීමේ අංකය | නම | උපන් දිනය | ලකුණු | වාරය | වර්ෂය |
|---|---|---|---|---|---|
| 1426 | කවිඳු ප්‍රභාෂ්වර | 2005.05.23 | 69 | 1 | 2014 |
| 1427 | මීනාදේවි රාමනාදන් | 2005.08.12 | 82 | 1 | 2014 |
| 1428 | මොහොමඩ් මලික්කාර් | 2005.02.07 | 47 | 1 | 2014 |
| 1426 | කවිඳු ප්‍රභාෂ්වර | 2005.05.23 | 79 | 2 | 2014 |
| 1427 | මීනාදේවි රාමනාදන් | 2005.08.12 | 68 | 2 | 2014 |
| 1428 | මොහොමඩ් මලික්කාර් | 2005.02.07 | 66 | 2 | 2014 |

i. එය හඳුන්වන්නේ කුමන නමකින්ද?
ii. එම නිසා ඇතිවන අවාසි සඳහන් කරන්න.